කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

WW/T/18/09/10/01

නිවේදන අංකය : **01**
වර්ණය : ඇම්බර්

## අකුණු පිළිබඳව අනතුරු ඇඟවීම

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2018 සැප්තැම්බර් මස 10 වන දින රාත්‍රී. 08.30 වන තෙක් වලංගු වන පරිදි
2018 සැප්තැම්බර් මස 10 වන දින ප.ව. 04.30 ට නිකුත් කරන ලදී.

### උතුරු, උතුරු-මැද, නැගෙනහිර, ඌව සහ මධ්‍යම පළාත් වල මහජනතාව සඳහා

### විමසිලිමත් වන්න !

ඉහත අනතුරු ඇඟවීම් ප්‍රදේශවල ඉදිරි පැය කිහිපය තුල (පැය හතරක පමණ කාලයක් සඳහා) ගිගිරුම් සහිත වැසි සමග ප්‍රභල අකුණු සහ ගිගිරුම් ඇතිවීමේ හැකියාව පවතී. සමහර ස්ථානවලට මි.මී. **50** ට වැඩි තරමක් තද වැසි බලාපොරොත්තු වේ.

ගිගිරුම් සහිත වැසි සමග පැ.කි.මී. **70-80** ක පමණ කෙටිකාලීන තද සුළං ද ඇති විය හැක.

### අද සවස 04.30 වනවිට තත්ත්වය

උතුර, ඌව සහ මධ්‍යම පළාත්වල ක්‍රියාකාරී වලාකුළු පද්ධති වර්ධනය වී ඇත.

### අනාවැකිය

**මෙම ක්‍රියාකාරී වලාකුළු පද්ධති ඉදිරි පැය කිහිපය තුලදීද සක්‍රියව පවතිනු ඇතැයි බලාපොරොත්තු වේ.**

### ආරක්ෂිත පියවර:

අකුණු සහ ගිගුරුම් පවතින අවස්ථාවල පහත ආරක්ෂිත පියවරයන් අනුගමනය කරන මෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මහජනතාවට අවවාද කෙරේ.

- එළිමහනේ හෝ ගස් යට නොසිටිය යුතු අතර ආරක්ෂිත ගොඩනැගිල්ලක් හෝ සංවෘත වාහනයක් තුළ රැදී සිටින්න.
- කුඹුරු, තේ වතු, ක්‍රීඩා පිටි මෙන්ම ජලාශ වැනි විවෘත ස්ථාන වල රැදී සිටීමෙන් වලකින්න.
- රැහැන් සහිත දුරකථන සහ විදුලියට සම්බන්ධ කරන ලද විදුලි උපකරණ භාවිතයෙන් වලකින්න.
- බයිසිකල්, ට්‍රැක්ටර් සහ බෝට්ටු වැනි විවෘත වාහන භාවිතයෙන් වලකින්න.
- තද සුළං හේතුවෙන් ගස් හා විදුලි රැහැන් බිම ඇද වැටීමට ඉඩ ඇති බැවින් ඒ පිළිබඳව සැලකිලිමත් වන්න.
- හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් ගේ සහය පතන්න.

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2018/9/10
Time : 16 : 33
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE

Spatial rainfall distribution: Isolated: <25%, A few: 26-50%, Many: 51-75%, Most: 76-100%
Rainfall amount (mm): Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more